

විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2025, 04 (01): 26-41

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

පශ්චාත් කාලිදාස මහාකාව්‍ය කෘතීන්හි පරිහානීය ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

ඒ.ඒ.ජී.ඩී. කරුණාතිලක

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
Gayanthadushan6@gmail.com

Abstract

Poetry holds a central place in literature, and within poetic traditions, the Mahākāvya (Epic poetry) occupies a significant position. This research focuses on the characteristics of decline evident in Mahākāvya works composed during the post-Kālidāsa period. The term post-Kālidāsa refers to the era following the celebrated Sanskrit poet Kālidāsa. The primary research problem addressed in this study is the identification and analysis of the declining features present in epic poetry of this later period. Accordingly, the main objective of the study is to gain an understanding of the nature and causes of these declining tendencies in post-Kālidāsa Mahākāvyas. According to various literary critics, epic poetry after Kalidasa shows several features of decline, including an overemphasis on complex meter and prosodic complexities, and a strong tendency among poets to display their grammatical and technical expertise. These factors contribute to an artificial and highly ornate linguistic style that is different from the natural beauty and aesthetic balance found in earlier epic works. Moreover, the intense effort made by poets after Kalidasa to create works superior to earlier masterpieces can also be identified as a significant reason for this decline. This study highlights the transformation of Sanskrit epic poetry in the post-Kalidasa period and provides insight into the literary and aesthetic changes that took place during this period.

Key words: *Characteristics of decline, Post-Kālidāsa Mahākāvya, Sanskrit literature*

1. හැඳින්වීම

'සාහිත්‍යය' යන්න නානාර්ථවත් ය. 'සහිත' ශබ්දයා කෙරෙන් පර ව 'ෂ්‍යඤ්' ප්‍රත්‍යය එක් වීමෙන් සාහිත්‍යය යන්න නිෂ්පන්න වූ බව ප්‍රාචීන සුධීහු සඳහන් කරති(රේවත හිමි 2016, p. 86). එහි දී ශබ්දකල්පද්‍රැමය "සාහිත්‍යං, ක්‍රී, ස්ත්‍රී, (සහිත+ඝ්‍යඤ්.) නේත්‍රනම්. සහිතස්‍ය භාවඃ ඉත්‍යාර්ථේ ආ ප්‍රත්‍යයේන නිෂ්පන්නම් පරස්පර සාපේක්ෂණාං තුල්‍යරූපානාං යුගපදේකක්‍රියාන්වයිත්වං සාහිත්‍යම් ඉති ශ්‍රාහ විවේකඃ"(රාධාකාන්තදේව 1967, p. 344). යනුවෙන් පෙන්වා දෙන්නේ සාහිත්‍ය යනු ස්ත්‍රී ලිංගක පදයක් වන අතර සහිත සහ ඝ්‍යඤ් යන ශබ්දද්වයේ ඓක්‍යයෙන් නිෂ්පන්න රූපයක් බව යි. සහිත වූයේ සාහිත්‍ය යනු සරලාර්ථය යි. එහි ආ ප්‍රත්‍ය එක් ව ඇත. මෙහි දී ශ්‍රාහ විවේකයන්ගේ අදහසක් ද උද්ධරණය කොට ඇත. මෙකී සාහිත්‍යය තුළ 'කාව්‍ය' සංකල්පය අතිශය ප්‍රමුඛ ස්ථානයක් ගනී. 'කව' හෝ 'කු' ධාතුවෙන් නිපන් කාව්‍යය යන්නෙන් ස්තුත්‍යාර්ථයක් ධ්වනිත කරයි(රාධාකාන්තදේව 1967, p. 87). මීට අමතර ව කෝශ ග්‍රන්ථයන්හි කාව්‍ය ශබ්දය නේකාර්ථවත් ලෙස පෙන්වා ඇත. තත් කාව්‍ය සාහිත්‍යයාර්ණවයෙහි විහිදී පැතිරී යන මහාකාව්‍ය සාහිත්‍යයෙහි පශ්චාත් කාලිදාස මහාකාව්‍ය කෘතීන්හි පරිභානීය ලක්‍ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයෙහි භාවය යි.

2. ක්‍රමවේදය

උක්ත පර්යේෂණ ගැටලුව විසඳීමෙහි ලා ප්‍රපංචවේදී විධික්‍රමය යටතේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කෙරුණු අතර එහි දී ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කෙරිණි.

3. සාකච්ඡාව

පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි පරිභානීය ලක්‍ෂණ පිළිබඳ අධ්‍යයන කිරීමට නම් තත්කාලීන කෘති මොනවා ද යන්න පිළිබඳ පැහැදිලි අනුබෝධයක් තිබිය යුතු ය. කාලිදාස විසූ කාලය නිර්ණය කරගැනීම ප්‍රථමයෙන් සිද්ධ කරගත යුතු ය. කාලිදාස ලෞකික කාව්‍ය සාහිත්‍යයේ මාන්‍යතම කවියා වසයෙන් පෙර'අපර දෙදිග ම පිළිගැනේ(සේනානායක 2017, p. 274). "පෙර කල කවියෝ නම් කවරහු දැ යි වටහා ගනු වස් අතැඟිලි ගණින සඳ කාලිදාසගේ නාමය සුළඟිල්ලෙහි පිහිටියේ ය. (හෙවත්, ඔහු පළමු වැන්නා වසයෙන් ගණන් ගැනිණි.) අදටත් ඔහු හා සමාන කවියෙකු නො ලැබෙන හෙයින් වෙදඟිල්ලට "අනාමිකා (නම් නැත්තී)" යන නාමය අර්ථවත් ව යෙදෙයි(සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 2019, p. 38). යන සිලෝවෙන් උක්ත ප්‍රකාශය තහවුරු වෙයි. කාලිදාසාපදානබන්ධ කථාන්තර බහුල ව ඇතත් මෙහි දී ඔහු විසූ කාලය කුමක් ද යන්න පමණක් විද්වද් මතාවලින්ට අනුව විමර්ශනාක්‍ෂියට භාජනය කෙරේ.

අ. ක්‍රි. ව. 6 වෙනි ශතවර්ෂයේ හෙවත් වික්‍රම හා ප්‍රවරසේන රජවරුන්ගේ කාලයේ දී ය. ජ්‍යොතිර්විදාභරණ " ධන්වන්‍තන්තරීක්‍ෂපණකාමරසිංහ ශංකු..." ශ්ලෝකයෙන් ද තවත් කරුණු රැසකින් ද ඒ බැව් 'ආජාතේ' පෙන්වා දෙයි(සේනානායක 2017, p. 275).

ආ. අශ්වඝෝෂපාදයන්ටත් නාට්‍ය රචක භාසයන්ටත් පසු කාලයක ය. කාලිදාසාපදානබන්ධ වික්‍රමාදිත්‍ය රජු යනු දෙවෙනි චන්‍ද්‍රගුප්ත රජු ය. ඔහු ක්‍රි. ව. 380 - 413 යන කාලයේ ජීවත් වූවෙකි(බෙරිඩේල් 1964, p. 25-26).

මෙකී මත දෙස බලන විට කාලිදාස භාෂ, අශ්වඝෝෂපාදයන්ට පසු කලෙක විසූ බව නිගමනය කළ හැකි ය. මෙනිසා පශ්චාත් කාලිදාස මහාකාව්‍ය කෘති ලෙස කිරාතාර්ජුනීය, රාවණවධ, ජානකීහරණ, ශිශුපාලවධ හා නෛෂධචරිත ආදි මහාකාව්‍යය පෙන්වා දිය හැකි ය.

කාව්‍ය යනු කුමක් ද යන්න විග්‍රහ කිරීමට මෙහි දී වැඩි ප්‍රායාසයක් නො ගැනේ. නානා විෂයයන් 'කාව්‍ය' යනුවෙන් ද එය විවිධත්වයෙන් වර්ණනා කිරීම 'කවි' යනුවෙන් ද සරල ව පෙන්වා දිය හැකි ය. එම කවියාගේ කාර්යය කාව්‍යය යි. (කවෙඃ කර්ම කාව්‍යම්) ලොව පවත්නා දෑ අපූර්ව ලෙස වර්ණනා කිරීමෙන් කවියා ප්‍රතිභාන්විත වන බව ආනන්දවර්ධන ධ්වන්‍යාලෝකයේ දී පෙන්වා දෙයි. (ප්‍රතිභා අපූර්වවස්තු - නිර්මාණ - ක්‍ෂමා ප්‍රඥා) කවියාගේ යථෝක්ත ක්‍රියාව සමුපශෝභිත වන්නේ හේ සහෘදයප්‍රිය වේ. කාව්‍ය සාහිත්‍යයෙහි ක්‍රම විකාශය පහත දිස් වෙයි.



3.1. පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි පරිහානීය ලක්‍ෂණ

මෙතැන් සිට පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි පරිහානීය ලක්‍ෂණ වෙන වෙන ම සාකච්ඡාවට භාජනය කෙරේ. එහි ලා මහාකාව්‍ය ලක්‍ෂණ ද භාවිතයට ගැනේ.

3.1.1. සර්ග සංඥා පිළිබඳ විෂමතා

'සෘජ්' ධාතුවෙන් නිෂ්පන්න 'සර්ග' යන කෘදන්ත නාමයෙන් 'මැවීම' යන අර්ථය සූචනය කරයි. ආලංකාරිකයන්ට අනුව මහාකාව්‍යයක් යනු සර්ග සංහිතාවක්(පේමරතන හිමි 2001, p. 09).[1] සර්ගයක් බොහෝ විට ඒකීය තේමාවකින් යුතු පද්‍ය සමූහයකින් සමුපශෝභිත ය. මහාකාව්‍යයක් වීමට විවිධ තේමාගත ව සර්ග රැසක සමවායක් ම තිබීම ප්‍රමාණවත් වන්නේ නැත. ඒ ඒ සර්ග සමවාය අන්‍යෝන්‍ය සම්බන්ධයකින් ද යුක්ත විය යුතු ය. එක ම ක්‍රියා සිද්ධියේ විවිධ වර්ණනීය අවස්ථා ඒ ඒ සර්ගයන්හි නියෝජනය විය යුතු ය. තද් නිරූපණයේ ද එක් සර්ගයක් අනෙක් සර්ගයට සම්බන්ධිත විය යුතු ය. එහෙත් මෙම 'සර්ග' සංඥා භාවිතය පශ්චාත් කාලිදාස සමයේ දෙදරා යාමකට ලක් වූ හැඩක් පෙනී යයි. එය පහත ආකාරයෙන් පෙන්වා දිය හැකි ය.

අ. සර්ග යන්න වෙනුවට වෙනත් සංඥා සර්ග (පරිච්ඡේද) පර්යාය ව භාවිතයට පෙලඹීම.

ආ. 'සර්ග' යන සංඥාව අන්‍ය සාහිත්‍ය කෘති වෙනුවෙන් ද යෝජනය කිරීම.

මහාකාව්‍යයක පරිච්ඡේද සංඥාකරණ විෂයෙහි ලා 'සර්ග' යන්න භාවිත කිරීම අනිවාර්ය කොට සැලකූ සමයක ඉන් පරිබාහිර ආදේශක නාම භාවිත කිරීමට පෙලඹීම සැලකිය යුතු කාරණයකි. උදාහරණ වසයෙන් පහත මහාකාව්‍ය පෙන්වා දිය හැකි ය. කේරළ කවියකු වූ වාසුදේව සිය මහාකාව්‍යය වන යුධිෂ්ඨිරවිජයෝදයේ දි පරිච්ඡේද නාම තබා ඇත්තේ ආශ්වාස නමිනි.

බාලභාරතය මහාකාව්‍යය රචනා කළ අමරචන්ද්‍රසූරි එහි පරිච්ඡේද පර්ව යනුවෙන් නම් කර ඇති අතර වාදීභසිංහ ඔඩයදේව ඔහුගේ ක්‍ෂත්‍රචූඩාමණී මහාකාව්‍යයේ පරිච්ඡේදකරණය කර ඇත්තේ ලම්බක නමිනි.

මේ අයුරින් මහාකාව්‍ය පරිච්ඡේද නාමකරණය පිළිබඳ ඒකමතිකත්වය ගිලිහී යාම පශ්චාත්කාලීන මහාකාව්‍යයන්හි පරිහානීය ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය.

3.1.2. සර්ග ප්‍රමාණ පිළිබඳ විෂමතා

මහාකාව්‍යයක සර්ගයන්හි ප්‍රාමාණිකත්වය ආලංකාරිකයන් විසින් පෙන්වා දී තිබේ. සර්ග අටකට නො අඩු ව සර්ග තිහකට නො වැඩි ව මහාකාව්‍යකරණය සිද්ධ කළ යුතු බව සහිත්‍යදර්පණයේ දී නිර්දේශ කොට ඇත(Kane 1956).[2] එසේ ම සර්ග සංඛ්‍යාව විස්තීර්ණ නො විය යුතු බැව් කාව්‍යදර්ශය පෙන්වා දෙයි(පේමරතන හිමි 2001, p. 10).[3] එහෙත් පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන් මෙම නියම අතික්‍රමණය කොට ඇත. එහෙත් මෙකල ද ශ්‍රේෂ්ඨ කොට සැලකෙන ඇතැම් මහාකාව්‍ය මෙම නියමයට යටත් ව ඇති බව පෙනී යයි.

කාලිදාස කාලීන මහාකාව්‍ය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී බුද්ධචරිත මහාකාව්‍යය ගත් කල අශ්වඝෝෂපාද සර්ග විසි අටක් ඒ සඳහා යොදා ඇති අතර ඔහුගේ ම සෞන්දරානන්දයේ දී සර්ග දහ අටක් භාවිත කර ඇත. කාලිදාස කුමාරසම්භවයේ දී සර්ග අටක් භාවිත කළ අතර රඝුවංශයේ දී සර්ග දහ නවයක් ඉදිරිපත් කර ඇත.

පශ්චාත් කාලිදාස මහාකාව්‍ය විමසා බැලීමේ දී භට්ටිගේ රාවණවධයේ සර්ග විසි දෙකක් ඇති බව පෙනී යයි. භාරවීගේ කිරාතාර්ජුනීය මහා කාව්‍යයේ සර්ග විසි හතක් ඇති අතර මාඝගේ ශිශුපාලවධයේ සර්ග විස්සක් අන්තර්ගත වේ. ශ්‍රී හර්ෂගේ නෛෂධචරිත මහාකාව්‍යයේ සර්ග විසි දෙකක් යෙදී ඇත.

පශ්චාත් කාලිදාස කාලීන අවම සර්ග සහිත මහාකාව්‍ය

මහාකාව්‍ය	කර්තෘ	සර්ග සංඛ්‍යාව
ත්‍රිපුරදහන	වාසුදේව	3
රාඝවයාදවපාණ්ඩවීය	චිදම්බර	3
රාමපාලචරිත	සන්ධ්‍යාකරනන්දී	4
නලොදය	අඥාතය	4
කංසවහ	රාමපාණිවාද කවි	4
උෂානිරුද්ධ	එම	4
නලොදය	අඥාතය	4
කීචකවධ	නීතිවර්මන්	5
උත්තරරාමචරිත	අඥාතය	5
ශෞරිකථොදය	වාසුදේව	6
ජගද්‍රූචරිත	සර්වානන්ද	6
රාවණාර්ජුනීය	භට්ටභීම	6
අර්ජුනරාවණීය	එම	6

පශ්චාත් කාලිදාස කාලීන අධික සර්ග සහිත මහාකාව්‍ය

මහාකාව්‍ය	කර්තෘ	සර්ග සංඛ්‍යාව
නෛෂධචරිත	-	22 කි යැයි ද 100 කි යැයි ද 60 කි යැයි ද 120 කි යැයි ද මත රැසකි.
හරිවිජය	රාජානක රත්නාකර	50
පාර්ශ්වාභ්‍යුදය	ජිනසේන	42

උක්ත මහාකාව්‍යන්හි සර්ග සංඛ්‍යා භාවිතය දෙස අධ්‍යයන කරන විට පෙනී යන්නේ එතෙක් පැවැති සම්ප්‍රදාය අතික්‍රමණය කොට පශ්චාත් කාලිදාස මහාකාව්‍ය කෘති සම්පාදනය වූ බව යි. එය තත්කාලීන මහාකාව්‍යයන්හි පරිහානියට හේතුවක් වූ බව පෙන්වා දිය හැකි ය.

3.1.3. වෘත්ත පිළිබඳ විෂමතා

ආලංකාරිකයෝ සර්ගයන්හි භාවිත කළ යුතු වෘත්ත පිළිබඳ ද මඳ මඳ වසයෙන් හෝ පෙන්වා දුන්හ. දණ්ඩි පෙන්වා දෙන්නේ "සරසන ලද සංක්ෂේප නො වන රස භාවයන්ගෙන් අතොරක් නොමැති ව ඉතා අඩු ද වැඩි ද නො වූ සර්ගයන්ගේ ශ්‍රැතිසුඛදායි වෘත්තයන්ගෙන් සහ අන්‍යෝන්‍ය සම්බන්ධයක් ඇති සියලු සර්ගයන්හි වෙනස් වෙනස් වෘත්තයන්ගෙන් වූ අලංකාර කාව්‍ය ලෝකයාගේ සිත් ගන්නේ චිරස්ථායි වන්නේ ය" යනුවෙනි(ප්‍රේමරතන හිමි 2001, p. 09).[4] පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි වෘත්ත භාවිතය පිළිබඳ රෝහණ සෙනෙවිරත්න පෙන්වා දෙන්නේ "අතිවිචිත්‍ර, දුර්ලභ සහ දුර්ගම වෘත්ත සමඟ ක්‍රීඩා කරමින් සංස්කෘත ඡන්දස් ශාස්ත්‍රයේ කෙළ පැමිණියෝ නම් පශ්චාත්තන මහාකවීහු ය"(සෙනෙවිරත්න 2005, p. 38). වසයෙනි. මෙකල විසූ බොහෝ කවීහු ලඝු වෘත්ත භාවිතයට රුචි වූහ(සෙනෙවිරත්න 2005, p. 39). නිදසුන් ලෙස භට්ටිගේ මහාකාව්‍යය පෙන්වා දිය හැකි ය.

අනුෂ්ටුභ් (04 - 09 සර්ග ද 14 - 22 සර්ගය තෙක්)
උපජාති (01, 02, 11 සහ 12 වන සර්ග)
ආර්යා (13 වන සර්ගය)
පුෂ්පිතාග්‍රා (09 වන සර්ගයේ බහුතරය)

මීට අමතර ව පශ්චාත්තන මහාකවීහු සංකීර්ණ - දුර්ගම වෘත්ත මතු නො ව ශබ්දාලංකාර විෂයෙහි ද එහි දෘශ්‍යමාන ගුණකයක් වූ චිත්‍රබන්ධ (Carmina figurata) සහ ප්‍රහේලිකා නිර්මාණයෙහි ද තත්පර වූහ. එවිසින් හසල වූහ(සෙනෙවිරත්න 2005, p. 39).

යමක ශබ්දාලංකාර

සරසාං සරසාං පරිමුච්‍ය තනුං පතතාං පතතාං කකුභො බහුශඃ

සකලෛඃ සකලෛඃ පරිතඃ කළුරණෛරුදිතෛරිව ඛංනිචිතම්

භට්ටිකාව්‍ය - 10: 10 - අයුග්මපාදාදියමක

භාරවි කිරාතාර්ජුනීයේ 15 වන සර්ගයේ දී ප්‍රකට කරන කෞශල්‍ය සලකා බලන කල්හි එහි පද්‍ය විවිධ යමක විශේෂවලින් යුක්ත බව පෙනේ.

01 - 03 පද්‍ය - යමක

05 පද්‍යය - ඒකාක්ෂරපාද යමක

07 පද්‍යය - නිරෞෂ්ඨ්‍ය

08 - 10 පද්‍යය - යමක

12 පද්‍යය - ගෝමූත්‍රිකා

14 පද්‍යය - ඒකාක්ෂර

16 පද්‍යය - මහායමක/ සමුද්ගක

18 පද්‍යය - ප්‍රතිලෝමානුලෝමපාද

22 - 23 පද්‍යය - ප්‍රතිලෝමශ්ලෝකද්වය

25 පද්‍යය - සර්වතෝභද්‍ර

27 පද්‍යය - අර්ධභ්‍රමක(සෙනෙවිරත්න 2005, p. 39).

මෙපරිද්දෙන් භාෂාව සූක්ෂ්ම ව භාවිත කොට තම තමන්ගේ කාව්‍ය සැරසීම මෙකල කවීන් උසස් කොට සැලකූ බව පෙනේ. එසේ ම චිත්‍රබන්ධ භාවිත කොට තමන්ගේ පාණ්ඩිත්‍ය විශද කිරීම පිණිස මිස උසස් අර්ථාන්විත කාව්‍යයක් නිර්මාණය කිරීමට පශ්චාත්තන කවීන් උත්සුක නොවූ බව ද පෙනේ. මාඝ විසින් කෘත ශිශුපාලවධ මහාකාව්‍යය ද මෙහි ලා නිදසුන් කොට පෙන්වා දිය හැකි ය.

ජජෞජජාජිජිජ්ජාජි තං තතොතිතතාතිතුත්

භාභොභීභාභිභූභාභූ රාරාරිරරිරිරරඃ - (ශිශුපාලවධ - 19 : 03)

(ඉක්බිති යුද්ධයේ ජයග්‍රාහකයා වන, අතිශයමානී සතුරන් මඬින්නා වූ ද තාරකාවන්හි උද්දීප්ති ව ඇත්තා වූ ද අභීත හස්තීන්ගේ ඝාතකයාගේ තේජස ඇත්තා වූ ද යුද්ධ රථයක අසුන් අරා සිටි ඒ ප්‍රතිනායක වීරයා සටන් ඇරඹී ය.) මෙවන් යමකාලංකාර සහිත පද්‍ය ලංකාවේ දී ලියවුණු ජානකීහරණ මහාකාව්‍යයෙන් ද දැක ගත හැකි ය.

තතා තීති තතො තීතා තාත තාතාත්ත තත්තෞ

තතොතොතිතතෞතෙතෞ තාතෙ තුත්තිතතෙතතිඃ - (ඒකාක්ෂර බන්ධන - 18 : 57)

ශ්ලේෂ භාවිතයෙන් ද පශ්චාත් මහාකාව්‍ය ඉහළින් ම වැජඹෙයි. සප්ත සන්ධාන කාව්‍ය එහි ලා දෙස් දෙයි. මෙහි වෘෂභනාථ, ශාන්තිනාථ, පාර්ශ්වනාථ, නෙමිනාථ, මහාවීරස්වාමි යන ජෛන තීර්ථංකරවරුන්ගේ සහ කෘෂ්ණ - බලදේව යන දෙදෙනාගේ චරිත සප්තකය එක්වර වර්ණිත යි(සෙනෙවිරත්න 2005, p. 22).

"අවනිපතිරහාසීද්විශ්වසෙනාශ්වසෙනාභිදශරථනාමනාඃ යඃ සනාභිඃ සුරෙශඃ

බලිවිජයී සමුද්‍රඃ ප්‍රෞඪසිද්ධාර්ධසංඥඃ ප්‍රසෘතමරුණතෙජස්තස්‍ය භූකච්ඡපස්‍ය" - (සප්තසන්ධාන කාව්‍ය - 01: 54)

අරුත් සියයක් ඇති හෙවත් ශ්ලේෂාර්ථ සියයක් ඇති මෙය මහාකාව්‍ය තරංගයේ කූටය වසයෙන් රෝහණ සෙනෙවිරත්න පෙන්වා දෙයි(සෙනෙවිරත්න 2005, p. 58). එසේ ම අනුලෝම වසයෙන් කියවන විට නල චරිතයත් ප්‍රතිලෝම වසයෙන් කියවන විට හරිශ්චන්ද්‍ර චරිතයත් කියැවෙන ලෙස අඥාත කර්තෘක නලහරිශ්චන්ද්‍ර කාව්‍යය ද මෙහි දී සඳහන් කළ යුතු ය.

"නිජමො'තිප්‍රජානාරිනලොච්ඡස්සදමොජනි
යඃ ශ්‍රියශ්චන්ද්‍රඉන්ද්‍රශ්ච ගොප්තා ගොස්සර්වපූරිහ" - නල චරිතය
නිජමොදස්සච්ඡලොනරිනාජාප්‍රතිමොජනි
හරිපූර්වස්සගොතාප්ගොශ්චන්ද්‍රඉන්ද්‍රශ්ච යඃ ශ්‍රියඃ - හරිශ්චන්ද්‍ර චරිතය(සෙනෙවිරත්න 2005, p. 59).

පද්‍යයේ කුමන ස්ථානයකින් ගත්ත ද අරුත් සහිත පද්‍ය රැසක් නිපදවා ගැනීමට හැකි පද්‍ය ද මෙකල නිර්මාණය විණි. මෙය ඉතා ම සංකීර්ණ මෙන් ම සූක්ෂ්ම වූවකි. මෙහි මූලපද්‍යයේ අක්ෂර ගණනට සමාන පද්‍ය ගණනක් ඉන් ලැබේ. කෘෂ්ණමූර්තිගේ කඩ්කනබන්ධ රාමායණ කාව්‍ය මෙහි නිදර්ශන වේ. මෙම එක ම ශ්ලෝකයේ ශ්ලෝක 64ක් ඇති අතර සමස්ත කාව්‍යය ම එක ම පද්‍යයකි.

"නෙතාදෙවලීනාමාශා ධනාධීන නෙකලොකී
මාසාෘනාං භාරව්‍යායොගීශං පායාදෙතං රාමෙ රාජා"(සෙනෙවිරත්න 2005, p. 59).

මහාකාව්‍ය සප්තකයක් (සතක්) රචනා කොට ඇති ශිවස්වාමින් විසින් රචිත කප්පිණාභ්‍යුද මහාකාව්‍යයේ දී චිත්‍රබන්ධන රැසක් දැකගත හැකි ය.

කවිකාව්‍යනාමගර්භචක්‍ර (18 : 147)

ගෝමූත්‍රිකාබන්ධ (18 : 48 / 18 : 67 / 18 : 88)

පද්මබන්ධ (18 : 74)

මුරජබන්ධ (18 : 74 / 18 : 41)

කාඤ්චිබන්ධ (18 : 129 / 18 : 130)

අර්ධභ්‍රමක (18 : 130)

සර්වතොභද්‍ර (18 : 85)(සෙනෙවිරත්න 2005, p. 40).

මේ ආදි වසයෙන් මේවායේ කාව්‍ය රස ජනනය කිරීමට වඩා කවියගේ පාණ්ඩිත්‍ය හුවා දැක්වීම පිණිස භාෂාව භාවිත කොට ඇති බව පෙනේ. මෙනිසා මෙකී ලක්ෂණය ද පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි පරිහානීය ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය.

3.1.4. වර්ණනා පිළිබඳ විෂමතා

වර්ණනා හා භාරතීය කාව්‍ය අතර ඇත්තේ අවියෝජනීය බැඳීමකි. වර්ණනා කිරීමට භාරතීය කවියන් දැක්වූ සුනිශිත ප්‍රඥාව සකු සැහැරියේ කව් දෙස හෙළන ආලෝචනයෙන් මනා ව අවබෝධ කරගත හැකි ය. පශ්චාත් කාලිදාස සමයේ මහාකවීන්ගේ කෘති තුළ විශේෂයෙන් ප්‍රකට වන කාරණාත්‍රයක් රෝහණ සෙනෙවිරත්න පෙන්වා දෙයි(සෙනෙවිරත්න 2005, p. 49).

වර්ණනා අතිවිස්තාරිත වීම
වර්ණනා, කාව්‍ය රසෝද්පාදන ශක්‍යතාව අතින් අවප්‍රමාණ වීම සහ ශාස්ත්‍රීය නිරවද්‍යතාව අතින් අධිප්‍රමාණ වීම.
වර්ණනීය අවස්ථා විසින් කාව්‍ය වෙත වර්ණනා කැඳවනු ලැබීම වෙනුවට, ප්‍රාධාන්‍යය හිමි කර වර්ණනා ඊට උචිත අවස්ථා නිර්මාණය කර ගැනීම.

යථාස්ථානයේ වර්ණනා කිරීම විශ්වනාථයන් විශේෂ කොට සැලකූ බව පෙනේ. එහෙත් පශ්චාත් මහාකාව්‍යන්හි එකී 'යෝග්‍ය ස්ථාන වර්ණනා' දැකීම සාපේක්ෂ ව අඩු ය. ව්‍යාකරණ ඥානාභිවෘද්ධිය සහ අලංකාර හා ඡන්දස් ශාස්ත්‍ර පක්ෂයේ වර්ධනය ආදි හේතු කරණ කොට ගෙන විස්තෘත වර්ණනාවන්ට පශ්චාත් මහාකවීන් පෙලඹුණු බව පෙනී යයි. එසේ ම ඊට අතුරු හේතු කිහිපයක් සෙනෙවිරත්න පෙන්වා දෙයි.

කාව්‍ය ශාස්ත්‍ර විෂයයෙහි තමන් සතු නිපුණතා ප්‍රදර්ශනයට කවීන් පෙලඹීම.
ඡාත්‍රයන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නිදර්ශන එක විට සැපයීමේ වුවමනාව.
විවිධ වෘත්ත - අලංකාර - ප්‍රහේලිකා චිත්‍රබන්ධනාදිය අත්හදා බැලීමේ ආශය.

ආලංකාරිකයන් මෙකී වර්ණනා උපුටමින් සංස්කෘත 'කාව්‍යශාස්ත්‍රය' විස්තෘත කිරීමෙහි යෙදී සිටීම කවීන්ට කාව්‍යකරණය පිණිස මනා උත්ප්‍රේරකයක් වීම(සෙනෙවිරත්න 2005, p. 49).

මේවායේ වර්ණනයන් කෙතරම් විස්තාරිත වූවා ද කියතොත් වස්තු විෂයයට වඩා කවියා අවධානය දී ඇත්තේ සාලංකාරවත් වර්ණනාවන්ට ය. එහි ප්‍රතිඵලයක් වූයේ කාව්‍යයේ ගතිකත්වය ගිලිහී යාම යි. එක් එක් වර්ණනාවන්ට එක් එක් සර්ගය බැගින් නියම වීම එයට සාධක ලෙස සෙනෙවිරත්න පෙන්වා දී ඇත.

රිතු වැනුම් (ඍතු වර්ණනා)

01. කප්පිණාභ්‍යුදය - 07 සර්ගය
02. ශිශුපාලවධ - 06 සර්ගය
03. ශ්‍රී කණ්ඨචරිත - 06 සර්ගය
04. හරවිජය - 03 සර්ගය
05. කිරාතාර්ජුනීය - 04 සර්ගය
06. ජානකීහරණ - 02 සර්ගය (වසන්ත)
    03 සර්ගය (වස්සාන)
    04 සර්ගය (ශරත්)

සැඳෑ වැනුම්

01. කප්පිණාභ්‍යුදය - 11 සර්ගය
02. ශ්‍රී කණ්ඨචරිත - 10 සර්ගය
03. හරවිජය - 20 සර්ගය
04. ජානකීහරණ - 08 සර්ගය

දියකෙළි වැනුම්

01. කප්පිණාභ්‍යුදය - 09 සර්ගය
02. ශ්‍රී කණ්ඨචරිත - 09 සර්ගය
03. කිරාතාර්ජුනීය - 07 සර්ගය
04. ජානකීහරණ - 02 සර්ගය

මල් නෙළීම (කුසුමාවචන) වැනුම්

01. කප්පිණාභ්‍යුදය - 10 සර්ගය
02. ශ්‍රී කණ්ඨචරිත - 07 සර්ගය
03. කිරාතාර්ජුනීය - 08 සර්ගය
04. ශිශුපාලවධ - 07 සර්ගය

යුද වැනුම්

01. කප්පිණාභ්‍යුදය - 17 - 19 සර්ගය
02. ශිශුපාලවධ - 20 සර්ගය
03. ශ්‍රී කණ්ඨචරිත - 23 - 24 සර්ගය
04. හරවිජය - 42 - 50 සර්ගය
05. කිරාතාර්ජුනීය - 11 - 12 සර්ගය
06. ජානකීහරණ - 18 සර්ගය(සෙනෙවිරත්න 2005, p. 49-50).

මේ ආදි වසයෙන් පශ්චාත් මහාකාව්‍ය අයථා අතිවර්ණනාවන්ගෙන් යුක්ත බව පෙන්වා දිය හැකි ය. ඉතා සුළු සිද්ධි පවා පරමෝත්කර්ෂයෙන් වර්ණනා කිරීමට යෑමෙන් තම කාව්‍යයේ ගුණ හීනත්වය තමන් විසින් ම සිද්ධ කොට ගෙන ඇති බවක් පෙනේ. එස්. එන්. දාස්ගුප්තගේ ප්‍රකාශයක් උද්ධෘත කරන සෙනෙවිරත්න පෙන්වා දෙන්නේ පශ්චාත්තන මහාකාව්‍යයක්, කථාවින්‍යාසයේ අවශ්‍යතා සීමා අතික්‍රමණය කළ වර්ණනා සංහිතාවක් ලෙස විනා සමවාය සම්බන්ධය සහිත සාරසමස්තයක් වසයෙන් වර්ණනා කළ නො හැක්කේ නම් එය අරුමයක් නො වේ ය යනුවෙනි(සෙනෙවිරත්න 2005, p. 50). මේ විස්තර කිරීමට අනුව පෙනී යන්නේ වර්ණ අතිවිස්තාරිත වීම පශ්චාත් මහාකාව්‍යන්හි පරිහානීයත්වයට හේතුවක් වූ බව යි.

3.1.5. භාෂාව පිළිබඳ විෂමතා

මහාකාව්‍යයන්හි භාෂාව පිළිබඳ ද ආලංකාරිකයන් විවිධ මත ඉදිරිපත් කොට ඇත. දණ්ඩාචාර්යයන් පෙන්වා දෙන්නේ මහාකාව්‍යය සර්ග, සංස්කෘතයෙන් ම නිර්මාණය විය යුතු බව යි(පේමරතන හිමි 2001, p. 20).[5] භාමහ පෙන්වා දෙන්නේ ග්‍රාම්‍ය වූ සද්'රුත්වලින් තොර, අලංකාර වූ කාව්‍ය මහාකාව්‍ය නම් වන බව යි(Sankara Rama Sastri 1956, p. 16).[6] මහාකාව්‍ය විෂයයෙහි ප්‍රථම දෙදරා යාම ඇති කරන ලද්දේ භට්ටි විසින් යැයි සෙනෙවිරත්න ප්‍රකාශ කරන්නේ භට්ටි විසින් කරන ලද රාවණවධයේ 12 වන සර්ගය සංස්කෘත සහ ප්‍රාකෘත යන භාෂාද්වයෙන් ම විරචිත හෙයිනි(සෙනෙවිරත්න 2005, p. 51). පෙර නොවූ මෙම ලක්ෂණය ආලංකාරිකයෝ 'භාෂාසමකාලංකාර' වසයෙන් පෙන්වා දුන්හ(ශ්‍රී හරිදාස් ශාස්ත්‍රී, p. 122).[7] මෙලෙස ආරම්භ ව ව්‍යාප්ත වූ භාෂා විවිධත්වය ව්‍යාප්ත වූ බවක් පෙනේ. නිදසුන් කිහිපයක් පහත දැක් වේ.

- කුමාරපාලචරිත හෙවත් ද්වාශ්‍රය කාව්‍ය - සංස්කෘත (සර්ග 20කි.)
  ප්‍රාකෘත (සර්ග 08කි.)
- හරිවිජය - භාෂා හයකින් ලියා ඇත. (භාෂාෂට්කෙ'පි ... ක්වචිදපි න ගතා භාරතී භාරවත්තම්...)

භාෂා විවිධත්වය සේ ම භාෂාව හැකි තරම් දුර්ගම කරමින් වාග්ගුම්ඵයක් බවට පත් කිරීමට ද උත්සහ දරනු ලැබූ බවත් දුර්ලභ සහ අබ්බෝහාරික වචන රැස් කොට, සියුම් උපක්‍රම මගින් විවිධ ශ්ලේෂාර්ථ ජනනය අරමුණු කොට ගෙන පද්‍ය ප්‍රබන්ධ කිරීම, පශ්චාත් මහාකවීන් සියලු දෙනා විසින් ම පාහේ කරනු ලැබූවකි(සෙනෙවිරත්න 2005, p. 51-52). පශ්චාත් මහාකාව්‍යයන්හි භාෂාව කෘත්‍රිම විලාසයක් (Artificial language) ගත් බව එකල ලියැවුණු කාව්‍යාධ්‍යයනයෙන් අවබෝධ කර ගත හැකි ය. දුර්බෝධ භාෂාවක් මෙකල පැවැති බවට පහත නිදර්ශන මගින් පෙන්වා දිය හැකි ය.

අ. වෛදික භාෂාගත සමාසගත සංකීර්ණ පද භාවිත කිරීම. භාරවී, සන්ධ්‍යාව යන අරුත දෙනු වස් 'අහ්නඃ අවශේෂ' යන්න ද දිවාකාලය යන අරුත දෙනු වස් 'රාත්‍රෙර්විපර්යය' යන්න ද යොදා ගනී.

ආ. දුර්ලභ වචන භාවිත කිරීම. (ජානකීහරණ - අධිත්‍යකා, ආයති, ඉක්ෂුශාටක, ඉරම්මදා, කර්පර, දත්තුරාම්, ද්වාපරම්, අදිධපත, අභීභවත්, උපානීයත, නිජග්නිරෙ)

ඇ. සමාසගත පර්යෝක්ති ප්‍රකාශන -

කුලිශයුදගොපකා (= ඉන්ද්‍රගෝප)
ධනුජේශුරිපු (= රාම)
වුරන්දරගොපක (= ඉන්ද්‍රගෝපක)
රක්තාක්ෂවාහන (= යම)
සිත්තෙරාධ්වන (= අග්නි)

ඈ. සම්භාව්‍ය සංස්කෘතයේ විරල වූ මහාභාරතයේ සහ රාමායණයේ වරක් පමණක් හමුවන ලෝට් පරස්මෛපදී ආඛ්‍යාත භාවිතය. රාවණවධයේ දී හට්ටී බොහෝ ලෙස මෙම ලකාරය භාවිත කොට ඇත(සෙනෙවිරත්න 2005, p. 52).

පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්ගේ භාෂා භාවිතය දෙස හෙළන මෙම සරල අලෝචනයෙන් වුව පෙනී යන්නේ කවීන් තම පණ්ඩිතමානීත්වය පළට කිරීමට යෑමේ ප්‍රතිඵලයක් වසයෙන් එකී නිර්මාණ කවිත්වයෙන් ඈත් කළ බවකි. මන්ද රසාස්වාදය ජනනයට වඩා භාෂාලංකාර ඥාන විශද කිරීම කවීන්ගේ පරමාර්ථය වූ හෙයිනි. මෙකී භාෂා කෘත්‍රිමත්වය පශ්චාත් කාලිදාස මහාකාව්‍යන්හි පරිහානීය ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය.

3.1.6. චරිත නිරූපණ පිළිබඳ විෂමතා

මහාකව්‍යයක චරිත පිළිබඳ ද ආලංකාරිකයන් විසින් අවශ්‍ය ප්‍රමාණයෙන් විස්තර දක්වන ලද බව පෙනේ. විශේෂයෙන් ම කථා නායකයා සකලසාධුගුණෝපලක්ෂිත චතුර උදාත්ත අභීෂ්ටයකු විය යුතු බව එහි දී පෙන්වා දී ඇත(පේමරතන හිමි 2001, p. 09).[8] කාව්‍යයේ දී නායකයා අභීෂ්ට කොට ප්‍රතිනායකයා දුෂ්ට දුර්දාන්තයකු කිරීම සාමාන්‍ය සාහිත්‍යයේ ක්‍රමය යි. එය පොදු සාහිත්‍ය ලක්ෂණයක් ලෙස පෙන්වා දිය හැකි ය. නායකයා සහ ප්‍රතිනායකයා සමාන ගුණධර වන්නේ නම් දෙදෙනාගේ ගැටීමෙන් ඵලාගමනයක් නැත. මෙනිසා ප්‍රතිනායකයා මද-මාන-අසූයා-විජිගීෂාදියෙන් යුක්ත විය යුතු ය. දෙදෙනා තුළ පර්යාය වන ගුණ තිබේ නම් එය ඉවත් කළ යුතු බව දණ්ඩාචාර්යයන් පෙන්වා දෙන්නේ එනිසා ය(පේමරතන හිමි 2001, p. 10).[9]

එහෙත් පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි චරිත නිරූපණය එතරම් යෝග්‍ය නො වුණු බව පෙනී යයි. එයට සාධකද්වයක් සෙනෙවිරත්න ගෙන හැර පායි.

අ. එක්කෝ කථාවස්තුවේ නායකයා සමඟ ගැටී යන ප්‍රතිනායකයාගේ චරිතයක් ඇත්තේ ම නැත. ආගමික චරිත සහිත කාව්‍යවල මෙනි.

ආ. නැතහොත් ප්‍රතිනායකයා හුදු නාමික, ගෞණ චරිතයකි, සක්‍රිය ව ඵලසිද්ධිය පිණිස දායක නො වේ(සෙනෙවිරත්න 2005, p. 54).

පශ්චාත් මහාකාව්‍යයන්ගේ චරිත නිරූපණයට එවන් කලදසාවක් උදාවීමට බල පෑ හේතු රැසක් අවබෝධ කරගත හැකි ය. ඒ අතර පහත හේතු ප්‍රධාන වේ.

අ. වර්ණනාවට හා ව්‍යාකරණය ගැන පමණක් සිතා චරිත නිරූපණය ගැන එතරම් සාධනීය අවධානයක් යොමු නො කිරීම.
ආ. කථා නායකයා කවියාගේ අනුග්‍රාහකයා වීම.
ඇ. නැතහොත් කවියාගේ ආගමික නිකායේ ප්‍රධානියා හෝ ශාස්තෘවරයා කථානායක වීම.

වසයෙනි. එතෙක් පැවැති රාම - රාවණාදි චරිත ඈත් ව විවිධ චරිත මහාකාව්‍යන්හි නායකත්වය ගත් බව පෙනී යයි. ඒ චරිත කිහිපයක් පහත පෙන්වා දෙයි.

3.1.6.1. ආගමික නායක / ශාස්තෘවර චරිත

අ. වරාංගචරිත (ජටාසිංහනන්දි / ජටිල / ජටාචාර්ය) - වරාංගමුනි චරිත
ආ. ධර්මශර්මාභ්‍යුදය (හේමචන්ද්‍ර) - ජෛන තීර්ථංකරවරුන් පසළොස් දෙනෙකු පිළිබඳ චරිත කථා)
ඇ. පාර්ශ්වනාථචරිත (වාදිරාජසූරි) - පාර්ශ්වනාථමුනිගේ චරිතය (මේ කෘතිය හමු වී නැත.)
ඈ. ජීවන්ධරචරිත (ගුණභද්‍රාචාර්ය) - ජීවන්ධර මුනිගේ චරිතය
ඉ. ත්‍රිෂෂ්ටිශලාකාපුරුෂචරිත (හේමචන්ද්‍ර) - සැට තුනක් වූ මහා පුරුෂ චරිත (ජෛන)

ඊ. අමාමස්වාමිචරිත හා මුනිසුව්‍රතචරිත (මුනිරත්නසූරි) - අමාමස්වාමි සහ සුව්‍රත යන ජෛනමුනිවරුන්ගේ චරිත

උ. ක්‍රිස්තුභගවත (පී. කේ. නාරායණපිල්ලේ) - ක්‍රිස්තු චරිතය

3.1.6.2. ධනවත් වෙළඳ චරිත

ජගඩූචරිත (සර්වානන්ද) - ගුජරාටයේ විසූ ජගඩූ නම් වූ ධනවත් වෙළෙන්දෙකුගේ චරිතය (මොහු කවීන්ට අනුග්‍රහ දැක්වූ බව සඳහන් වේ.)

3.1.6.3. රාජවංශ

අ. කීර්තිකෞමුදී (සෝමේශ්වරදේව) - ගුජරාටිහි බාසෙලා රාජවංශය ගැන තොරතුරු

ආ. රාෂ්ට්‍රෞඪයවංශකාව්‍ය (රුද්‍රකවි) - මයුරගිරිහි බාගුලස් රාජ පරම්පරාවේ ඉතිහාසය (රාෂ්ට්‍රෞඪය සිට නාරායණ තෙක්)

ඇ. වීරභානූදය - මෝගල් සමයේ රේව පරපුරේ ඉතිහාසය

3.1.6.4. කීර්තිමත් චරිත

අ. ආංගලසාම්‍රාජ මහාකාව්‍ය (ඒ. ආර්. රාජරාජවර්ම) - ඉංග්‍රීසි අධිරාජ්‍යවරුන්ගේ චරිත කථා

ආ.ශ්‍රී විවේකානන්දචරිත (ටී. ඒ. භාණ්ඩාර්කර්) - ස්වාමි විවේකානන්දගේ චරිතය(සෙනෙවිරත්න 2005, p. 54-56).

මෙම චරිත යෝජනය දෙස බලන විට පෙනී යන්නේ පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන් තුළ 'සම්මත නායක ලක්‍ෂණ' පෙන්වීට අසමත් නායකයන් පවා තම කාව්‍ය තුළ නායකයා ලෙස පත් කර ගෙන ඇති බව යි. එහෙත් වර්ණනා වෙත අභිරුචියක් දැක් වූ පශ්චාත් කවීහු අයෝග ස්ථානයන්හි අයෝග ලෙස වර්ණනාවන් සිදු කළහ. නායකයා ආගමික නායකයකු වුව ද ඔහු පිළිබඳ සඳහන් මහාකාව්‍යයේ මහාකාව්‍යයක තිබිය යුතු ම යැයි පිළිගන්නා සම්භෝග, විප්‍රලම්භ ශෘංගාරාදි නොයෙක් වර්ණනා ද යොදා ඇති බව පෙනී යාමෙන් එය මනාව අවබෝධ කර ගත හැකි ය.

චරිත නිරූපණය හරහා ද පශ්චාත් කාලිදාස මහාකාව්‍ය පරිහානිය කරා දිව ගිය බව උක්ත සංක්‍ෂිප්ත සටහනෙන් වුව සුඛාවබෝධ වේ. පශ්චාත් කාලිදාස සමයේ මහාකාව්‍යයන්හි ඇති පරිහානීය මහාකාව්‍ය ලක්‍ෂණ ඉහත සංක්‍ෂිප්ත ලෙස පෙන්වා දී ඇත. මෙතැන් සිට තත්කාලීන මහාකාව්‍යයන්හි පොදු පරිහානීය ලක්‍ෂණ කිහිපයක් සරල ව දැක්වේ.

3.1.7. අත්‍යන්ත විධිමත්භාවය හා නිරවද්‍යභාවය ආරක්‍ෂා කිරීමේ ආශය

පූර්වංගම කවීන්ගේ කාව්‍යයන්හි යම් යම් සාවද්‍ය ව්‍යාකරණ හා අලංකාර දැක ගැනීම එතරම් උගහට නැත. එසේ වූයේ එකල කවීන්ගේ ආශය වූයේ පාඨක හෘදයානන්දන කරන්නා වූ කාව්‍යයක් කිරීම විනා තම භාෂා ඡන්දෝලංකාර ඥානය පළට කිරීම නො වීම යි. එහෙත් පශ්චාත් කවීන් විසින් තම කාව්‍යයන් පාඨක රසාස්වාදයට වඩා ශාස්ත්‍ර ඥනය ප්‍රදර්ශනය කිරීම පිණිස රචනා කරනු ලැබූ බවක් පෙනී යයි. තත්කාලීන කවියනට තමන්ගේ කාව්‍යය තුළ සුසංවිහිතභාවය සහ අතිශය නිරවද්‍යතාව ඇති කිරීමට සිත් වීමට හේතු රැසක් රෝහණ සෙනෙවිරත්න පෙන්වා දෙයි.

අ. වෙනත් ප්‍රබන්ධාරම්මණ (අධ්‍යාපන ආරම්මණ මුඛ්‍ය විය.) විසින් කාව්‍යරස ප්‍රදානය කිරීමේ අරමුණ විතැන් කරනු ලැබීම.

ආ. පූර්වංගම කවීන්ගේ කෘති අධ්‍යයනයේ දී හඳුනා ගැනුණු දුර්වලතා නිවැරැදි කිරීමේ ආශය.

ඇ. සමකාලීන කවියන් අතර පැවැති තරගකාරී ස්වභාවය.

ඈ. ආලංකාරිකයන්ගේ අදහස් කවීන් කෙරෙහි ධනාත්මක ව බලපෑම.

ඉ. කවිතාව යනු වගා කර ගති කුශලතාවකැයි තහවුරු වීම.

ඊ. ප්‍රතිභා යන කාව්‍යහේතුව විචාරයට බඳුන් වීම සහ අනෙකුත් කාව්‍ය හේතු මගින් මෙම කාව්‍යහේතුව ජය ගැනීමට හැකි බව තහවුරු වීම(සෙනෙවිරත්න 2005, p. 61).

'කාව්‍ය දෝෂයන්ගෙන් දූෂිත නො වූ වචනය සියලු සම්පත් දෙන්නා වූ සුරභිධෙනුවකැයි ද දෝෂ දූෂිත කොට බඳින ලද වචනය තමන්ගේ අඥනකම ප්‍රකාශ කිරීමකැයි ද කියනු ලැබේ. යම් සේ ඉතා ශෝභාසම්පන්න වූ ශරීරය ඒකමාත්‍ර සුදු කබර ලපයක් නිසා ලෝවැස්සන් විසින් පිළිකුල් කෙරේ ද එමෙන් ම කාව්‍යය ද පද දෝෂාදි ස්වල්ප මාත්‍ර වූ දෝෂයකින් යුක්ත නම් ඒ දෝෂය නිසා කාව්‍ය නින්දිත වේ ය(ප්‍රේමරතන හිමි 2001, p. 03-04).[10] යන ආලංකාරිකයන්ගේ රීතිය ද එකී සුසංවිහිත භාවයට හා නිරවද්‍යතාවට හේතු වන්නට ඇත. මන්ද අලංකාර රහිත වුව ද දොස් තිබීම කාව්‍යයේ හීනත්වයට හේතුවක් බව එකල පිළිගැනීම යි. මෙය කෙතරම් සක්‍රිය වූයේ ද කිවතොත් ශිවස්වාමීගේ කප්පිණාභ්‍යුද මහාකාව්‍යයේ එක ම එක් ව්‍යාකරණ දෝෂයක් පමණක් තිබෙන බව විචාරක මතය යි. එනම් 'ප්‍රශුකා' යන පදය 'ප්‍රශුකා' ලෙස හ්‍රස්ව 'උ' කාරය සහිත ව දැක්වීම යි. එය ද ඡන්දසට යෝග්‍ය වීම පිණි මිස අහම්බ දෙයක් නො වේ(සෙනෙවිරත්න 2005, p. 62).

මෙකී නිරවද්‍යභාවය හා සුසංවිධිතභාවය කෙතරම් වුවත් එහි භාෂා භාවිත පාඨකයන්ගේ බෝධනයට සුඛාවහ නො වේ. කාව්‍යයේ ව්‍යාකරණ හා ඡන්දස්වලට දුන් එම අවධානය රසාස්වාදයට ලබා දුන්නේ නම් පශ්චාත් මහාකාව්‍ය පරිහානිය කරා නො ගොස් පූර්වංගම කාව්‍යවලට වඩා උසස් වීමට තිබුණි.

3.1.8. කවියාගේ ඥානය ප්‍රදර්ශනය කිරීමේ ආශය

පශ්චාත් කවීන් ද තම කාව්‍ය තුළ තමන් සතු විවිධ විෂයක ඥානය ප්‍රදර්ශනය කිරීමට උත්සාහ ගෙන ඇති බව දැකිය හැකි ය. පූර්වංගම කවීන් ලෙස ගණින කාලිදාසයන් ද සිය මහාකාව්‍යයන්හි දී තමන් සතු ව්‍යාකරණ, ඡන්දෝලංකාර, ෂඩ් දර්ශන මතු ද නො ව කාමශාස්ත්‍ර ඥානය ද ප්‍රදර්ශනය කොට ඇත. එහෙත් පශ්චාත් කවීන් මෙම ලක්ෂණ අතිශය ලෙස භාවිත කොට ඇත්තේ අනවශ්‍ය අන්දමින් බැව් පෙනේ. ඔවුන් කාව්‍ය රසයට වඩා තම දැනුම ප්‍රකාශ කිරීමට උත්සුක වී ඇති බව ඉන් ගම්‍ය වේ. 'ශාස්ත්‍රකාව්‍ය' බිහි වූයේ එහි ප්‍රතිඵලයක් වසයෙනි. නිදසුන් කිහිපයක් පහත දැක් වේ.

භට්ටිකාව්‍ය (=රාවණවධ) - භට්ටි - මහාකාව්‍ය තුළ ව්‍යාකරණ ඉදිරිපත් කරන මුල් ම කවියා මොහු ය. මෙහි රසය සෙවීමට පවා නො හැකි තරමට ව්‍යාකරණ ඥානය ඇත. භට්ටිකාව්‍යයේ සැඟ වී පවත්නා කාව්‍ය රසාස්වාද අපහසුවක් වේ යැයි කියවෙන්නේ සුවිපුල ශාස්ත්‍ර ඥානය ඒ වසා පැතර ඇති නිසා ය. එය ස්වයංකෘත ශාපයකැයි විචාරකයෝ දක්වති(සෙනෙවිරත්න 2005, p. 63).

කවිරහස්‍යය - හලායුධ - සංස්කෘතයේ විවිධ ක්‍රියාරූප යෝජනය පිළිබඳ ව්‍යාකරණ උපදේශ සපයයි.

අර්ජුනරාවණීය / රාවණාර්ජුනීය - භිම / භෞම / භෞමක - මෙහි ව්‍යාජයෙන් පාණිනීගේ නීති පහදනු ලබයි(සෙනෙවිරත්න 2005, p. 63-64).

මේ ආදි වසයෙන් කාව්‍ය රසය කවියාගේ විවිධ විෂයගත ඥානය ප්‍රදර්ශනය කිරීමට යාම කරණ කොට ගෙන පාඨකයාගෙන් ඈත් වූ බව සිතිය හැකි ය.

3.1.9. වර්ණනාවන්හි අධිකාරිය

වස්තු විෂය ක්‍රමික ව විස්තර කිරීම පසෙක ලා වර්ණනාවන් කෙරෙහි අවධානය යොමු කිරීම පශ්චාත් කාලිදාස කවීන්ගේ ලක්ෂණය විය. එහෙයින් කථාවින්‍යාසය හුදු ව්‍යාජෝපක්‍රමයක් (Pretext) බවට පත් විය(සෙනෙවිරත්න 2005, p. 64). මෙම ලක්ෂණය අසාධු - අපරිණත ලක්ෂණයක් ලෙස පෙන්වා දීමට බොහෝ දෙනා පෙලඹුන ලද්දේ මෙනිසා ය. මුල් කාලීන මහා කාව්‍යවල වර්ණනාවන් ප්‍රධාන වුව ද එහි අධිකාරයක් නො පෙනේ. සාහිත්‍ය නිර්මාණ සැම එකක ම පහේ මූලික කථා වින්‍යාසයක් තිබිය යුතු බව සාමාන්‍ය පොදු පිළිගැනීම යි. එහි කථා වින්‍යාසය තත් සාහිත්‍ය කෘතියෙන් වහා පාඨකයාට තේරුම් ගත හැක්කක් විය යුතු ය. එසේ නො වීම එකී සාහිත්‍ය කෘතියෙන් පාඨකයා ඈත් වීමට හේතුවකි. පශ්චාත් මහාකාව්‍යකරුවන් කථා වින්‍යාසය කෙරෙහි අවධානය යොමු නො කොට වර්ණනාවන්ට ම අවධානය යොමු කිරීමෙන් සිදු වූයේ පාඨක අපේක්ෂා භංගත්වය යි. පශ්චාත්තන කවියන් මෙසේ වීමට හේතු කිහිපයක් දැකිය හැකි ය.

- ආලංකාරිකයන්ගේ වර්ණනාවන් ලැබීමට රුචි වීම. ආලංකාරිකයන් පසසනු ලැබුයේ වර්ණනා චාතුර්යය මිස කථා වින්‍යාසය නො වේ.
- තමන්ගේ භාෂා පටුත්වයත් ඡන්දෝලංකාර ඥානයත් විවිධ විෂයක දැනුම් සම්භාරයත් ප්‍රකට කිරීමට හැකි වීම.
- මහාකාව්‍යක වර්ණනා අනිවාර්ය අංගයක් කොට බහුප්‍රතිගෘහිත ව පැවතීම.

පශ්චාත්තන කවීන්ගේ මහාකාව්‍ය කෘතිවල කථා වින්‍යාසය (Plot) සාපේක්ෂ ව සරල ව මෙන් ම ලඝු ද වූවකි. වර්ණන එකී සිහින් දේහයෙන් ගලවා ඉවත් කරනු ලැබිය හැකි වූවකි. කවර හෙයින් ද යත්, කෘතිය තුළ සමවාය සම්බන්ධය (Organic unity) දුර්වල බැවිනි(සෙනෙවිරත්න 2005, p. 67). යැයි රෝහණයන්ගේ මතය සාවද්‍ය නො වන බව මෙයින් සනාථ වේ.

මනෝහර කාව්‍යයක් නිර්මාණය වීමෙහි ලා ප්‍රධාන හේතු ත්‍රිත්වයක් ඇති බව ආලංකාරිකයන්ගේ අදහස් යි. එහෙත් මින් කුමක් ප්‍රධාන වේ දැ යි ඉඳුරා ම කීමට නො හැකි ය. ඒවා විවිධ ඡන්දෝලංකාර ශාස්ත්‍රඥයන් විසින් ප්‍රදර්ශිත විවිධ වූ නිර්වචනවල සඳහන් වේ.

අ. රාජානක ආනන්ද වර්ධනාචාර්ය - ප්‍රතිභාව
ආ. මංගලාචාර්ය - ව්‍යුත්පත්තිය
ඇ. භාමහ - ව්‍යුත්පත්තිය
ඈ. යායාවරිය රාජශේඛර - ව්‍යුත්පත්තිය සහ සතතාභ්‍යාස
ඉ. මම්මටාචාර්ය - ප්‍රත්‍යාභාව, ව්‍යුත්පත්තිය සහ සතතාභ්‍යාස

ශාස්ත්‍රාධ්‍යයනය මුග්ධයෙකුට වුව ද හැකි ය. එහෙත් කවිත්වය ප්‍රතිභාවෙන් ම ලැබිය යුත්තකැයි භාමහාචාර්ය පෙන්වා දෙයි.[11] මෙසේ වුවත් පශ්චාත් කාලිදාස මහාකාව්‍යයන්හි ප්‍රතිභාව එතරම් අගය වූවක් නො වන බවක් පෙනේ. මහාකාව්‍ය කෘති දෙස පශ්චාත් කවීන් තම ආලෝචනය යොමු කළත් ඔවුහු තත් කාව්‍ය තුළ දැක්කේ ප්‍රතිභාව නො වේ. ව්‍යුත්පත්තිය යි. කාලිදාසාදි පූර්වගාමීන්ගේ ව්‍යුත්පත්තිය පිළිබඳ එතරම් සතුටු නො වුණු ඔවුහු ඒවායේ ඇති දෝෂාපහරණය කොට ව්‍යුත්පත්තිය අතින් උත්තම කාව්‍ය නිර්මාණය කිරීමට උත්සුක වූහ. ඔවුගේ එම ක්‍රියාව සංස්කෘත මහාකාව්‍ය පරම පවිත්‍ර කිරීමේ ශුද්ධාත්මවාදී ව්‍යාපාරයක් (Puristic Movement) ලෙස රෝහණ සෙනෙවිරත්න සඳහන් කරයි(සෙනෙවිරත්න 2005, p. 68).

ව්‍යුත්පත්තිය පිළිබඳ විග්‍රහ කරන ආලංකාරිකයෝ විවිධ වු ඥාන ප්‍රමාණයන් පෙන්වා දෙති. ඒ වනාහි ව්‍යාකරණ (ශබ්ද) වෘත්ත භාවිතය (ඡන්දස්), වචනාර්ථ - ලක්ෂණ - ව්‍යඤ්ජනා යන අරුත් = අභිධානාර්ථ), ඉතිහාසය, ලෝකය

පිළිබඳ තතු, තර්ක ශාස්ත්‍රය නොහොත් නීතිය (යුක්ති). කලා ආදිය යැයි කාව්‍යාලංකාරය පෙන්වා දෙයි (Sankara Rama Sastri 1956).[12] එසේ ම සතතාභ්‍යාසය ද කාව්‍යකරණයෙහි කෙළ පත් පඬිවරුන් වෙත අධ්‍යයනය ද ආප්ත මහාකාව්‍ය පරිශීලනය ද කාව්‍ය ඇලුම් කරන්නන්ගේ ලක්ෂණයක් බව භාමහ පෙන්වා දී ඇත (Sankara Rama Sastri 1956).[13] උක්ත විචාරක අදහස්වලට අනුව පශ්චාත්තන කවියෝ කාව්‍යකරණයට බැස ගත්හ. උගතුන් සහ කවියන් අතර පරතරය මෙනිසා අඩු වූ බවට එස්. ලිනහාර්ඩ්ගේ අදහසක් සෙනෙවිරත්න පෙන්වා දෙයි.[14] කාව්‍ය මනහර වීමටත් පාඨකාභිරුච්‍යභිවර්ධනයටත් උත්සහ විය යුතු ය. එසේ වන්නේ ප්‍රයත්න රහිත හිතා මතා දුෂ්කෘත බන්ධන අන්තර්ගත නො කොට නිරායාස කවි සංකල්පනාවන්ගෙනි. එහෙත් පශ්චාත්තන මහා කාව්‍යයන්හි එය දැකගත නො හැකි ය. මෙය පශ්චාත්තන මහාකාව්‍යන්හි පරිහානීය ලක්ෂණයක් ලෙස පෙන්වා දීම යුක්ති යුක්ත ය.

4. සමාලෝචනය

මහාකාව්‍යයක වස්තු විෂය කුමක් විය යුතු ද යන්න දණ්ඩින් විසින් පෙන්වා දෙන්නේ ඉතිහාස සත්‍ය කථාවක් විය යුතු බව යි. එසේ ම එය ධර්ම, අර්ථ, කාම හා මෝක්ෂ යන චතුර්වර්ගය ඵල කොට ඇත්තක් විය යුතු ය. මෙය ප්‍රධාන ප්‍රයෝජනය කරගෙන මහාකාව්‍ය නිර්මාණය විය. ඒ අනුව බිජුවට වැඩී දලු ලා අතු පතර විහිදී ගිය සංස්කෘත කාව්‍ය සාහිත්‍යයේ අනුසාහිත්‍යාංගයක් වසයෙන් මහාකාව්‍ය සාහිත්‍ය හැඳින්විය හැකි ය. මෙම සටහනේ දී කාව්‍ය යනු කුමක් ද මහාකාව්‍ය ලක්ෂණ කවරේ ද කාලිදාස විසූ කාලය කුමක් ද යනාදිය පිළිබඳ විද්වද් මතවාද මාතෘකා ප්‍රවේශ යනු වස් සටහන් කරන ලදි. තදනන්තර ව පශ්චාත් මහාකාව්‍යයන්හි විශේෂ පරිහානීය මහාකාව්‍ය ලක්ෂණ අංකනාගත ව සකාරණ ව සහ සෝදාහරණ ව ද පෙන්වා දී ඇත. පශ්චාත් මහාකාව්‍යයන්හි පරිහානීය පොදු ලක්ෂණ දක්වන ලද්දේ ඉන් පසු ව ය.

උක්ත සටහන දෙස තුලනාත්මක මධ්‍යස්ථ දෘෂ්ටියක් හෙළන සහෘදය විචාරකයන්ට පෙනී යන ප්‍රධාන කාරණය නම් කවියා ප්‍රතිභාව දුර ලා වියරණ, ඡන්දස් සහ විවිධ විෂයක ඥානය ම ප්‍රදර්ශනය කරනු වස් කවිය අවිය කර ගැනීම නිසා පශ්චාත් කාලිදාස මහාකාව්‍ය, පරිහානියට පත් වී ඒවා පාඨකයාගෙන් ඈත් කර ඇති බව යි. කලාකෘතියක් පරිපූර්ණත්වයට පත් වීමට නම් ප්‍රධාන වසයෙන් භෝජකත්ව සහ භාවකත්ව යන උභයාංශයෙන් පරිපූර්ණ විය යුතු ය. භෝජකත්වය යනු පාඨකයාගේ ප්‍රතිභාව යි.(භාවයත්‍රී ප්‍රතිභා) භාවකත්වය යනු කවියගේ ප්‍රතිභාව යි. (කාරයිත්‍රී ප්‍රතිභා) මෙම ලක්ෂණ පශ්චාත් කාලිදාස සමයේ දැක ගැනීමට නො හැකි තරම් ය. පාඨකයාට සිදු ව ඇත්තේ ගණිත ගැටලුවක් විසඳන්නාක් මෙන් දුෂ්කර බන්ධනාදිය අවබෝධ කර ගැනීම යි. එයින් පාඨකයාට කාව්‍යයකින් ලබන පිරිපුන් රසාස්වාදයක් ඇති කර ගැනීමට නො හැකි ය. මෙය පාඨකයා කෙරෙන් පශ්චාත් මහාකාව්‍ය දුරස් වන්නට හේතු වූ බව සිතිය හැකි ය. සරල ව එයට හේතුව වන්නේ පශ්චාත් මහාකාව්‍යයන් කෘත්‍රිම වීම යි. නිරායාසයෙන් ඇති වන කවි සංකල්පනා ඒවායේ අල්ප වීම යි. ආයාසයෙන් ගොඩ නගන ලද දුෂ්කර බන්ධන, අනුප්‍රාස ඒ අතර බහුල වීම යි.

එහෙත් තත්කාලීන මහාකාව්‍ය අතර ශිශුපාලවධ, කිරාතාර්ජුනී වැනි ඇතැම් මහාකාව්‍ය වටිනාකමින් ඉහළ බව ද පිළිගත යුතු ය. එම නිසා මහාකාව්‍ය කිහිපයක් විමසා, සමස්ත පශ්චාත් මහාකාව්‍ය සාහිත්‍ය ම පිරිහුණු බව පිළිගැනීම ප්‍රඥාගෝචර නොවේ. කෙසේ නමුත් මෙකල මහාකාව්‍ය සමස්තයක් වසයෙන් පිරිහී ඇති බව සඳහන් කළ යුතු අතර ඒ පිරිහීම මහාකාව්‍යය ලක්ෂණ සහ කාව්‍ය රසාස්වාද වසයෙන් මිස ව්‍යාකරණ, ඡන්දස් අතින් නො වන බව ද ආවසානික ව සඳහන් කළ යුතු ම ය.

ආන්තික සටහන්

1. "සර්ගබන්ධෝ මහාකාව්‍යමුච්‍යතේ තස්‍ය ලක්‍ෂණම්"

2. "අෂ්ටසර්ගාන්න තු න්‍යූන්‍යං ත්‍රිංශත්සර්ගාච්ච නාධිකම්
මහාකාව්‍යං ප්‍රයෝක්තව්‍යං මහාපුරුෂකීර්තියුක්"

3. "සර්ගෛරනතිවිස්තීර්ණෛ''

4. "අලඞ්කෘතමසඞ්ක්‍ෂිප්තං - රසභාවනිරන්තරම්
සර්ගෛරනතිවිස්තීර්ණෛඃ - ශ්‍රව්‍යවෘත්තෛඃ සුසන්ධිභිඃ"
"සර්වත්‍ර භින්නවෘත්තාන්තෛ - රුපෙතං ලොකරඤ්ජකම්
කාව්‍යං කල්පාන්තරස්ථායි - ජායෙත සදලඞ්කෘති"

5. "සංස්කෘතං සර්ගබන්ධාදි - ප්‍රාකෘතං ස්කන්ධකාදිකම්
ආසාරාදීන්‍යපභ්‍රදශො - නාටකාදි තු මිශ්‍රකම්"

6. "සර්ගබන්ධෝ මහාකාව්‍යං මහතාං ච මහච්ච යත්
අග්‍රාම්‍යශබ්දමහර්ථං ච සාලංකාරං සදාශ්‍රයම්"

7. "ශබ්දෛරෙකවිධෛරෙව භාෂාසු විවිධාස්වපි
වාක්‍යං යත්‍ර භවෙත් සො'යං භාෂාසමක උච්‍යතෙ"

7. "චතුරෝදාත්තනායකම්"

8. "චතුරෝදාත්තනායකම්"

9. "යථා තථානුචිතං කිඤ්චින්නායකස්‍ය රසස්‍ය වා
විරුද්ධං තත්පරිත්‍යජ්‍යමන්‍යථා වා ප්‍රකල්පයෙත්"

10. "ගෞර්ගෞඃ කාමදුඝා සම්‍යක් - ප්‍රයුක්තා ස්මර්‍යතෙ බුධෛඃ
දුෂ්ප්‍රයුක්තා පුනර්ගොත්වං - ප්‍රායාක්තුඃ සෛව ශංසති"
"තදල්පමපි නොපෙක්‍ෂ්‍යං - කාව්‍යෙ දුෂ්ටං කථඤ්චන
ස්‍යාද්වපුඃ සුන්දරම්පි - ශ්වත්‍රෙණෛකෙන දුර්භගම්"

11. "ගුරූපදේශාත්ධ්‍යෙතුං ශාස්ත්‍ර ජඩධියො
කාව්‍යං තු ජායතෙ ජාතු කස්‍යදිත් ප්‍රතිභාවතඃ"

12. ''ශබ්දච්ඡන්දො'භිධානාර්ථා ඉතිහාසාශ්‍රයාඃ කථාඃ
ලොකො යුක්තිඃ කලාශ්චෙති මන්තව්‍යාඃ කාව්‍යගෞර්හ්‍යම්''

13. "ශබ්දාභිධායෙ විඥාය කෘත්වා තද්විදුපාසනම්
විලොක්‍යාන්‍යනිබන්ධාශ්ච කාර්යඃ කාව්‍යක්‍රියාදරඃ"

14. Scholars wrote handbooks, commentaries to philosophical and other works and frequently acted both as literary critics and as poets.

පරිශීලිත මූලාශ්‍රය

ප්‍රාථමික මූලාශ්‍රය

පේමරතන හිමි, වැලිවිටියේ. සංස්, (2001). **කාව්‍යාදර්ශය**, මරදානඃ සමයවර්ධන පොත්හල.

විද්‍යානිධි භට්ටාචාර්ය. (සංස්), **කිරාතාර්ජුනි**, කල්කටාඃ නිවේදිතාලේන - ස්ථීත සංස්කෘත විද්‍යාලය.

ශිශුපාලවධ (පරණ පොතකි. විස්තර නො දැක්වේ.)

ශ්‍රී හරිදාස ශාස්ත්‍රී. සංස්. **සාහිත්‍යකෞමුදී**, මථුරාඃ ශ්‍රී ගදාධර ගෞරහරි මුද්‍රණාලය.

ද්විතීයික මූලාශ්‍රය

අනුරුද්ධසිරි හිමි, කීඹියේ. (2018). **සුරභාණි- සාහිත්‍යකරණයෙහි බැඳුණු ප්‍රතිභා සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්**, ගාල්ලඃ ශ්‍රී සුධර්මාරාම මහා විහාර.

තිලකසිරි, ජයදේව. (2016). **සංස්කෘත කාව්‍ය සාහිත්‍ය**, මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

බෙරිඩේල් කීත්, ඒ., (ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම විසින් පරිවර්තිත) (1964). **සංස්කෘත කාව්‍ය සාහිත්‍යය**, මරදානඃ සමයවර්ධන පොත්හල.

රේවත හිමි, උඩවෙල හා නන්ද හිමි, අඹලියද්දේ. (2016). **සාධනා - 11 වන කලාපය**, කැලණිය විශ්වවිද්‍යාලයඃ සංස්කෘත පර්ශද් ප්‍රකාශන.

සෙනෙවිරත්න, රෝහණ. (2005). **පශ්චාත් කාලිදාස සමයේ සංස්කෘත මහාකාව්‍ය සාහිත්‍යය**, මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනානායක, ජී. එස්. බී., (2017). **සංස්කෘත සාහිත්‍යය**, මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සඟරා

සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව, සංස්, (2109). **රාජ්‍ය සාහිත්‍ය උත්සව දේශන පිටපත් - සංස්කෘත කාව්‍යයේ මහා සම්ප්‍රදායට ප්‍රතිපක්ෂ අප්‍රකට කාව්‍යය සහ කුකාව්‍යඃ විචාර පූර්වක අලෝචනා.**

Engish Books

Sankara Rama Sastri, C., (1956). **Kavyalankara**, Madras: The Sri Balamanorama Press.

Kane, P. V., (1956). **Sahityadarpana of Vishwanatha**, Bombay 4: Pandurang.

Madusudanamishra. (1974) **Kvyamimansa**, Varanasi: Chowkhamba Sanskrit series office.